# කියුම් සහ කෙරුම්!

1 වෙනි පිටුවෙන් ........

සැලකිය යුත්තේ මෙය සම්පූර්ණ වශයෙන් රටට සාමය උදා වූ පසු හිතේ නිස්කලංකයක් ඇතිව සකසන්නට හැකිවූ වාර්තාවක් බැවිනි. "හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ" යන සිහළ කියමනට අනුව සිතතොත් මේ අය වැය යෝජනා පිරික්සීමෙන් ඒවා සැබැවින්ම අනාගතයට ඵලදායී ප්‍රතිඵල ගෙනදෙන්නේදැයි කෙනෙකුට දැන්මම සිතාගත හැකිය.

## කියුම් සහ කෙරුම්

මෙතෙක් මේ ඉහළින් දැක්වූ සියල්ල තනිකරම කියුම් පමණකි. අළුත් කැබිනට්ටුව සහ අළුත් අයවැය මගින් පෙන්විය යුත්තේ කෙරුම්ය. මෙහිදී මා කරන්නට යන විස්තර විමසා බැලූවිට කෙරුම් කොයි ආකාර වේ දැයි යාන්තමින් හෝ ඔබට සිතාගත හැකි ය.

## නව කැබිනට් මණ්ඩලය

මේ නව කැබිනට් මණ්ඩලය දෙස බැලූ බැල්මට නිසැකවම පෙනෙන දෙයක් වෙයි. එනම් ඇමතිවරු විශාල සංඛ්‍යාවක් මෙහි පත්කර ඇති බවයි. රටේ ජනතාව බොහෝ දෙනා බලාපොරොත්තු වූයේ ඇමතිවරු සහ අමාත්‍යංශ අඩුම සංඛ්‍යාවකි. තිහකට හෝ බැරිම වුනොත් හතළිහකට පමණ ඇමති සංඛ්‍යාව කපාහරිනු ඇත කියා ය.

කැබිනට්ටුව වැඩි වන්නට හේතු වූයේ අන් කිසිවක් නොව විරුද්ධ පක්ෂයේ සිට රජයට පැන ආ මන්ත්‍රීවරුන් පිනවීම සඳහා ඇමති තනතුරු පිරිනමන්නට රාජපක්ෂ රජයට සිදුවීමයි. රජයේ ශක්තිය වර්ධනය කරගැන්මට රජය පැත්තට විශාල මන්ත්‍රී සංඛ්‍යාවක් ගොඩනගා ගැන්ම අවශ්‍යව තිබූ දෙයකි. බොහෝ දෙනා මේ පැත්තට පැන්නේද **පල ඇති රුකට වවුලෝ පියාඹා එති** යන කියමන සනාථ කරමින් තනතුරු වලට ඇති ආශාවෙනි. මෙය කාටවත් රහසක් නොවීය. මෙම නව සංක්‍රමිකයන් සඳහා අළුතින් ඇමති තනතුරු නිර්මාණය කරන්නට සිදුවූ බැවින් කැබිනට්ටුව විශාල මෙන්ම බරින්ද වැඩිවිය. මෙසේ කලබලයට නව ඇමතිවරු හා අමාත්‍යංශ තනන්නට යාමේදී ඔවුන් නඩත්තු කිරීමට රුපියල් මිලියන ගණන් මුදල් කන්දරාවක් වැයවීම ගැන කිසිදු සැලකිල්ලක් දක්වා ඇති බවක් නොපෙනේ. එහෙත් එම වැරැද්ද නිවැරදි කරගෙන ඇමති මණ්ඩලයේ සංඛ්‍යාව කපා පහත දැමීමට රජයට තිබෙන පළමුවන අවස්ථාව ද මෙම පටන්ගැන්මයි.

ජනාධිපතිවරයාට අවශ්‍ය නම් කැබිනෙට්ටුව අඩුකරන්නට හැකිකම ඇත. මක්නිසාද දැන් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ **2/3** වැඩි බලයක් ලැබී ඇති නිසාත්, මේනිසා ඔහුට අවශ්‍ය දේ කරන්නට බාහිර බලපෑමකට අවනතවීම අවශ්‍ය නොවන නිසාත්ය. එසේම දැන් ඇත්තේ අප පාර්ලිමේන්තු ඉතිහාසයේම වූ ඉතාම දුර්වල විපක්ෂයකි. මන්ත්‍රී කෙනෙකු අප්‍රසාදයට පත්වුවත් දැන් ඔහුට යන්නටය කියා වෙන තැනක්ද නැත. ගියා නම් එය දිවිනසා ගැනීමකි. දක්ෂතා, බුද්ධිමත් බව හා දුර දක්නා නුවණ, ඉහළ පරමාර්ථ ආදිය පෙරටු කොටගෙන කාටවත් නොනැමී අනාගත සංවර්ධනය කරා රට ගෙන යන බව ද මේ කියුම්වල ගැබ්ව ඇතත් කෙරුම්වලදී ඒ කාරණා අමතක කර ඇති බවක් පැහැදිලිවම අපට පෙනෙයි. රජය කැබිනෙට්ටුව සිහින් කළා නම් එයින් අනවශ්‍ය රොඩු බොඩු ඉවත් වී, රාජ්‍ය යන්ත්‍රය කියුම් කෙරුම් දෙකින්ම එක හා සමානව ක්‍රියාකරන, හොඳ ප්‍රතිපල ගෙන දෙන යන්ත්‍රයක් බවට හරවන්නට තිබුණි.

## බහු තනතුරු වලින් යුත් යකා දත් හිටවනවා වැනි ඇමතිකම් රාශියක් !

අළුත් ඇමති මණ්ඩලයේ තත්වය මෙසේය. ජ්‍යෙෂ්ඨ ඇමතිවරු **9** කි. කැබිනට් ඇමතිවරු **49** කි. නියෝජ්‍ය ඇමතිවරු **31** කි. සමස්ථය **89** කි. මුලින්ම කෙනෙකුට මෙය මහා ප්‍රහේලිකාවක් විය. මෙතරම් ඇමතිවරු කන්දරාවක් ලංකාව වැනි කුඩා රටකට කුමකටද? සති දෙකකට පසු ඊට හේතුව අනාවරණය වීය. ඒ මෙයයි.

ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් වශයෙන් ජ්‍යෙෂ්ඨයින් පිරිසක් පත්කර ඇත්තේ මේ නොබෝදා කුකුල් පැටවුන් මෙන් බිහි කරන ලද අනේක අමාත්‍යංශ අතර ඒකීය භාවයක් ඇතිකර ඒවා ඒකිනෙක නොහැප්පී, ඒ මේ අත නුදුවා ක්‍රමවත්ව ක්‍රියාත්මක වෙනවාදැයි සොයාබැලීම සඳහාය. අහෝ ! මේ මොන බහුබූතයක්ද? මුදල් නාස්තියක්ද?

මෙම අමාත්‍යංශ යොදා ඇති ආකාරය දෙස හොඳින් බැලුවොත් එකම කාර්‍යය ඇමතිවරු දෙදෙනෙකු විසින් කරනු ලබන බව පෙනේ. උදාහරණයක් වශයෙන් අමාත්‍ය නිමල් සිරිපාල **වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ** අමාත්‍යවරයාය. ඒ අතරේ දිනේෂ් ගුණවර්ධන **ජලසම්පාදන හා ජලාපවහන** (water supply and drainage ) අමාත්‍යවරයාය. එකම ජලය ඇමතිවරු දෙදෙනෙකු විසින් හසුරුවනු ලබයි. දැන් එතකොට ජලය පිළිබඳ ප්‍රශ්නයකදී ලාංකිකයෙකු කතා කළ යුත්තේ මේ දෙපලෙන් කොයි අමාත්‍යංශයට ද?

වාරිමාර්ග නිමල් සිරිපාලට දෙනවිට ඒ වතුරෙන් කරන ගොවිතැන් මහින්ද යාපාටය. ගොවිතැන් මහින්ද යාපාට දෙන නමුත් කෘෂිකර්ම සේවා ඔහුට බාරදී නැත. ඒවා එස්. එම්. චන්ද්‍රසේන ඇමතිටය. වතු සංවර්ධන මණ්ඩලය එක් අමාත්‍යංශයකට යන අතර අපනයන භෝග සඳහා තවත් අමාත්‍යංශයක් ඇත. මේ ආකාරයට එකම විෂය අමාත්‍යංශ දෙකක් මගින් කෙරෙන විට අවශ්‍ය කාර්‍යය සැබැවින්ම කෙරෙන්නේ කොයි අමාත්‍යංශයෙන්දැයි කාටවත් නිශ්චිතව කිව නොහැකිය. මේ ආකාරයට බොහෝ ඇමතිකම් බෙදා දී ඇති නිසා කවුරු කුමකට නිසි අයුරින් වගකිව යුතුදැයි ජනතාවට පමණක් නොව ඇමතිවරුන්ටද අවුලක්වී ඇති බව සැක නැත. හරි පිළිවෙල කට නැති මෙබඳු වැඩ වලට ගම්බද ජනතා වගේ බසින් කියනවා නම් මේ ඇමතිකම් දීම **යකා දත් හිටෙව්වා වාගේ** ක්‍රියා වලියකි.

***කාටවත් නොනැමී අනාගත සංවර්ධනය කරා රට ගෙන යන බවද මේ කියුම් වල ගැබ්ව ඇතත් කෙරුම්වලදී ඒ කාරණා අමතක කර ඇති බවක් පැහැදිලිවම අපට පෙනෙයි. රජය කැබිනෙට්ටුව සිහින් කළා නම් එයින් අනවශ්‍ය රොඩු බොඩු ඉවත් වී, රාජ්‍ය යන්ත්‍රය කියුම් කෙරුම් දෙකින්ම එක හා සමානව ක්‍රියාකරන, හොඳ ප්‍රතිපල ගෙන දෙන යන්ත්‍රයක් බවට හරවන්නට තිබුණි.***

තවත් අතකින් බැලුවහොත් ශ්‍රීලංකාවට විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කරගෙන අපේ නව ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනා කරවීමේ දැඩි උවමනාව ඇත. මේ සඳහා ඉතා කාර්‍යක්ෂම පැහැදිලි සැළැස්මක් අපේ රජයේ හා ක්‍රම සම්පාදනයේ ඇති බව එම විදේශීය ආයෝජකයන්ට තේරුම් යන ආකාරයේ නිරවුල් රාජ්‍ය යාන්ත්‍රයක් තිබිය යුතු වෙයි. 80 දශකයේ ඉන්දියාව තම ආර්ථිකය පිටතට විවෘත කළ අවස්ථාවේ බොහෝ අළුත් ආයෝජකයන් කළ විවේචනයක් මට සිහිවෙයි. එනම් ඉන්දියාවේ පාලන යාන්ත්‍රණයේ තවම පවතින්නේ බ්‍රිතාන්‍ය පාලනය ඉතුරු කර දමා ගිය අකාර්යක්ෂම නිලධාරි වාදය බවයි. ඉන්දියාව මේ වන විට ඒ දුර්වලතාවෙන් මිදී ඇති බව පෙනෙයි.

පසුගිය දශක වල සිට අපි හොඳ යාන්ත්‍රණයකට පිවිස සිටින්නෙමු. එහෙත් අවාසනාවට එම යාන්ත්‍රණය හසුරුවා ගන්නට නොහැකි තත්වයකට පත්කරගෙන ඇති බව පෙනේ. කියුම්වලට ගැලපෙන සේ කෙරුම් ද සකසා ගැන්මට මේ කාලයයි.

## අය වැය (බජට් එක) නව දිසාවකට යොමුවීමක්

මෙවර අය වැය දෙස බැලූ බැල්මට පෙනෙනුයේ එය සුබදායක නව දිසාවකට යොමුවී ඇති බවයි. මෙතෙක් දශක ගණනාවක් පුරා අප ඇත් දැක ඇති ලංකා අයවැය වනාහි ආදායම සහ වියදම අතර පරතරය පියවා ගැනීමට බදු සහ භාණ්ඩ මිළ ඉහළ දැමීමේ සුපුරුදු ක්‍රමයයි. එය සැබැවින්ම ගෘහණියන් මාසිකව හදන සිල්ලර බඩුවල මිළත් ගෙදරට යන වියදමත් සංසංදනය කර බැලීමක් වැනිය.

සමහර අයට **අය වැය** යනු නත්තලට **නත්තල් පප්පා** තෑගි ගෙනෙන තෙක් බලා හිඳීමක් වැනිය. එයට හේතුව රජයේ සේවකයින් අය වැයෙන් පඩි වැඩිවීමක් බලාපොරොත්තු වන අතර දිළිඳු ජනතාව අත්‍යවශ්‍ය බඩුමිළ පහත වැටේයයි බලාපොරොත්තු වෙති. එහෙත් අයවැයෙන් ලොකුම දිනුම ලබන්නේ කඩකාරයාය. ඔහු නොයිවසිල්ලෙන් ඉන්නේ අයවැයෙන් පසුදාම හැම බඩුවකම මිළ ඉහළ දාන්නටය. මොන රජය ආවත් වාසි වෙළෙන්දාටය. එහෙත් රජයේ සේවකයාද, දිළින්දා ද, සාමාන්‍ය පුරවැසියා ද අය වැය දකින්නේ දකුණු අතින් යමක් දී වමතින් ආපසු ගැනීමක් ලෙසිනි. යම් භාණ්ඩයක මිළ ටිකක් බස්සා තවත් භාණ්ඩ රැසක මිළ ඉස්සීම අය වැයේ සිරිත හෙයින් කොහොම ගියත් පාඩු විඳින්නෝ ඔව්හු වෙති.

## සංවර්ධන මූලික අයවැයක්

මෙවර අය වැය රටේ සංවර්ධනය මූලික කරගෙන සැකසුණු අයවැයක් වීම පැසසුම් කටයුතුය. මෙයට පෙර අප රටේ බොහෝ අය වැය ග්‍රාමීය සමාජය ගැන සඳහන් කළා මිසක සැබැවින්ම එය අරමුණු කර තැනුණේ නොවේ. මහින්ද චින්තනය මත සැකසුණු මෙය ගම කේන්ද්‍ර කොට පියවර ගෙන ඇත.





- We have the inherited wisdom to tolerate all opinion and take mature decisions. We have a tradition of understanding our problems and conflicts and finding solutions for them…
- There will be no development in the absence of peace, nor peace in the absence of development…
- We wish to see everyone in this land become a stakeholder in the future victories that will flow from this great victory, regardless of political differences…
- සියළු මතවාද ඉවසමින් පැසුණු තීරණගන්නට හැකි සහජ ඥාණයක් අපට ඇත. අපේ ප්‍රශ්න හා ගැටුම් තේරුම්ගෙන ඒවාට විසඳුම් සොයා ගන්නට හැකි සම්ප්‍රදායක් අපට තිබේ.
- සාමයෙන් තොර සංවර්ධනයක්ද, සංවර්ධනයෙන් තොර සාමයක්ද නොවනු ඇත.
- මේ භූමියේ සියළුදෙන දේශපාලන වෙනස්කම් කුමක් වුවද, මේ විජයග්‍රහණය තුළින් මතුවන සියළු අනාගත ජයග්‍රහණයන්හි දී එහි කොටස් කරුවන් වනු දැක්ම අපේ බලාපොරොත්තුවයි.

**The first ship to enter Hambanthota Port on the Opening Day**
**විවෘත කළ දිනයේ හම්බන්තොට වරායට ඇතුළු වුණු ප්‍රථම නෞකාව**





## අරමුණු සහ නියමිත කාලය

අරමුණුකර ඇත්තේ දිළිඳුකම නසා ගමට අවශ්‍ය ජලය, විදුලිය, ජලාපවහන සහ හොඳ මංමාවත් පහසුකම් නොඅඩුව සැපයීමටය. මේවා යථා පරිදි සැකසෙන විට ගමද නගර තත්වයට දියුණුව අමතර ආදායම් මාර්ග විවෘතවනු ඇත. කියුම් වලට වඩා සැබැවින්ම කෙරුම් අවශ්‍ය වන්නේ මෙහිදීය. මේ දේවල් නොපමාව සිදුවන්නේ එවිට ය.

යුද්ධය සමයේ අපේ ඇත්තන් කියුම්වලට වඩා කෙරුම්වලින්ම වැඩ පෙන්වූ සැටි අපි හොඳින් දනිමු. යුද්ධය අප ජයග්‍රහණය කළේ ඒ නිසාමය. අරමුණු සාක්ෂාත් කරන්නේ කෙරුම්ය. රට සංවර්ධනයට සැබැවින්ම අවශ්‍ය ඒ යුද්ධයේදී වැනි ක්‍රියාන්විතයකි. රජයේ පියවර සුබදායකය.

එහෙත් වටේ සිටින වන්දිභට්ටයින් උපදෙස් දෙන නියාවෙන් රටේ නායකයින් සංවර්ධන මගින් ඉවතට ගෙන වැරදි මං ඔස්සේ ගෙන යන්නට අර අඳින බව අපට පෙනේ. එම පන්දම්කාරයින් පන්නා දමා සංවර්ධන අරමුණු කෙරෙහි සිත් යොමා කටයුතු කරන මෙන් රජයට මතක් කර සිටිමු.

## හවුන්ස්ලෝ ජනහඬ පදනමෙන් නොමිලේ ඇස් කණ්ණාඩි බෙදා දේ!

**බටහිර ලන්ඩනයේ හවුන්ස්ලෝ ප්‍රදේශයේ හවුන්ස්ලෝ ජනහඬ පදනම මගින් පසුගිය ඔක්තෝබර් මාසයේ ඇස් කණ්ණාඩි රැසක් නොමිලේ ශ්‍රීලංකාවට ප්‍රධානය කරන ලදී. මාතර යටියන නිමලයාවත්ත පුරාණ විහාරස්ථානයේදී සිදුවූ මෙය යටියන සමරවීර පදනම සූදානම්කර තිබිණ.**

